දුරකථන / தொலைபேசி / Telephones } 011-2136600 / 011-2136650

ලේකම් / செயலாளர் / Secretary } 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2876169 / 011-2876181

විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail } info@psc.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.psc.gov.lk

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.


මගේ අංකය / எனது இல. / My No. } PSC/APL/8/51/2026

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2026.10.23

**ලේකම්**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

<u>2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>

<u>ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය</u>

ඉහත සඳහන් සේවාවේ නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කර ඇත.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති මෙම අභියාචනා අතරින් ක්‍රියාත්මක විය යුතු දිනය සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කර නොමැති සියලු ස්ථාන මාරු වහාම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව, වාර්ෂික ස්ථාන මාරුවීම් ලද සියලුම නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස මෙයින් දන්වමි. ස්ථාන මාරු ක්‍රියාත්මක වීම සඳහා වෙනත් නිශ්චිත දිනයක් ලබා දී ඇති ස්ථාන මාරුවීම් ද, එම දින සිට අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතු වේ.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ වෙන වෙනම දන්වා යැවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2(ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනය සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි.

05. 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන

වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙසද ඔබ වෙත දන්වා සිටිමි.

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

07. එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිම.

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා - 2026

| අනු අංකය | නම | වර්තමාන සේවා ස්ථානය | නව සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය |
|---|---|---|---|---|
| 01 | එම්.එල්.එම්. ඉර්ෂාඩ් මහතා | මාවනැල්ල ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය | ගම්පොල ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 02 | ටී. ඉලන්කුමාරන් මහතා | යාපනය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | වවුනියාව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 03 | ඩී.පී.වයි.එන්. කුමාර මයා | මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 04 | ජේ. ප්‍රසාන්ත් මිය (පී. ජනනි මිය) | මඩකලපුව ගුරු විදුහල | කලවන්චිකුඩි (පද්දිරිප්පු) ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය 2027.01.01 දක්වා දීර්ඝ කිරීම |
| 05 | සී. මොරින් මෙනවිය | මඩකලපුව ගුරු විදුහල | කාත්තන්කුඩි ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය 2027.01.01 දක්වා දීර්ඝ කිරීම |
| 06 | එම්.එස්.ආර්. කන්දගේ මිය | මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 07 | අයි.එන්. කාලසිංහ මිය | මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 08 | ඊ.ඒ.පී.කේ. එදිරිසිංහ මිය | මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | කුරුණෑගල ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 09 | ආර්. රජබාලන් මහතා | කෝප්පායි ගුරු විදුහල | වවුනියාව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |

15/10/2026

2026/10/15